# ඇහැටුවැව ප්‍රදේශයේ නීතිවිරෝධී ලෙස ඉදිකරන ලද විදුලි වැටකට එරෙහිව සීමාසහිත පාරිසරික පදනමේ විශේෂ අයදුම්පතට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අවසර

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඇහැටුවැව නාකොලගනේ පුරාණ රජ මහා විහාරය අවට සිදුකල අනවසර කළ එළිකිරීම සහ අනවසරයෙන් විදුලි වැටක් ඉදිකිරීම සම්බන්ධව සීමාසහිත පාරිසරික පදනම විසින් ගොනු කරන ලද අංක SCFR (SPL) LA 289/2017දරන අභියාචනා කිරීමට අවසර ඉල්ලීමේ විශේෂ අයදුම්පත 2018 අගෝස්තු මස 1 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සළකා බැලීමෙන් පසු එම ඉල්ලීම සඳහා අවසර ලබා දී ඇත.

පසුගිය වසර කිහිපය තුළ සීමාසහිත පාරිසරික පදනම විසින් ශ්‍රී ලංකාවේ සිදුවන වනාන්තර එළිකිරීම් වලට විරුද්ධව කටයුතු කළ අතර ඒ සම්බන්ධව ඇති පැමිණිලි, වගකිව යුතු රජfයa නිලධාරීන්ගේ අවධානය වෙත යොමු කිරීමද සිදු කළේය. 2015 වර්ෂයේ මුල් කාලයේ සිට, ඇහැටුවැව ප්‍රදේශයේ සිදුවන වනාන්තර එළිකිරීමක් සහ වනාන්තර බිම් පරිහණය සම්බන්ධව පැමිණිලි සීමාසහිත පාරිසරික පදනම වෙත ලැබී තිබුණි. ඇහැටුවැව නාකොලගනේ පුරාණ රජ මහා විහාර බිම ආශ්‍රිතව මහා පරිමාණ බිමක්, එනම් අක්කර 15-20ක් පමණ බිම් ප්‍රමාණයක සිදුවන වනාන්තර එළිකිරීමක් සහ ඒ අසල අනවසරයෙන් ඉදිකරන ලද විදුලි වැටක් සමබන්ධව පැමිණිලි ලැබී තිබුණි. ලැබුණු තොරතුරු අනුව මෙම මහා පරිමාණ එළිකිරීම සහ විහාරය අසල පිහිටි අඹ වගා කටයුතු පෞද්ගලික ආයෝජකයින් විසින් සපයන අරමුදල් මගින් නාකොලගනේ පුරාණ මහා විහාරය විසින් සිදුකරන ලද්දකි.

ඇහැටුවැව සහ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් බල ප්‍රදේශයන්, ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ වැඩිම අලි-මිනිස් ගැටුම් ප්‍රමාණයක් සිදුවන ප්‍රදේශයන් ලෙස ප්‍රසිද්ධ වී ඇත. ඇහැටුවැව නාකොලගනේ පුරාණ රජ මහා විහාරය විසින් මෙම වනාන්තර එළිකිරීම සහ විදුලි වැට ඉදිකිරීම සිදුකර ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති සහ උපදෙස් වලට පටහැනි වන ආකාරයෙනි. වනාන්තරය එළිකර වැට ඉදිකර ඇති බිම් ප්‍රමාණය, මෙහි ඉතිරිව තිබූ ස්වභාවික වනාන්තර බිම් ප්‍රදේශ වලින් එකක් වූ අතර මෙය වන අලින්ට නිතර ආහාර සහ ජලය සොයා ගමන්කිරීමට තිබූ අලිමන්කඩකි. රේඩියෝ තරංග පටි සවිකර ඇති වන අලින්ගේ GPS සංචරණ තොරතුරු වලට අනුව, මෙම ප්‍රදේශය සහ අවට ස්වභාවික වනාන්තර ප්‍රදේශය, වන අලි 200 ක ප්‍රමාණයකගේ සංචරණයට භාවිතාවන ප්‍රදේශයකි.

මෙම ප්‍රදේශයේ වනාන්තර එළිකිරීම හෝ සංවර්ධන කටයුතු මගින් වන අලින්ගේ සංචරණ මාර්ග අවහිර වීම නිසා අත්‍යවශ්‍ය සම්පත් සහ වාස භූමි වලට හානි සිදුවිය හැක. නියත වශයෙන්ම මේ හේතුවෙන් වන අලින්ට ආහාර සොයා ගම් වැදීමට සිදුවන අතර, එමගින් වගාවන් වලට සිදුවන හානිය වැඩි විය හැක. වන අලින්ට, ස්වභාවික වනාන්තර වලට ඇතුළු වීමට ඇති මං හරස් කිරීම නිසා ඔවුන්ට මිනිසුන් වෙසෙනා ප්‍රදේශයන් වෙතට ඇතුළු වීමට සිදුවන අතර අලි-මිනිස් ගැටුම වැඩි වීමද සිදුවේ. දැනට, උදැසන කාලයේදී සහ හවස් කාලයේදී පාලුකඩවල සහ අත්තරගල්ල වැව් වෙතට ගමන් කරන අලි 100- 200 ක් පමණ වන අලි රංචු කිහිපයක් ඇහැටුවැව ප්‍රධාන මාර්ගය හරහා මාරුවන බවට දැකගත හැකිය.

මේනිසා සිදු විය හැකි මිනිස් ජීවිත හානි සහ පරිසරයට සිදුවිය හැකි බලපෑම් හේතුවෙන්, සීමාසහිත පාරිසරික පදනම සහ ඇහැටුවැව ප්‍රදේශයේ පරිසර සුරැකුම් එකමුතුව සංවිධානයේ සාමාජික, මෙමඟින් බලපෑම් වී ඇති ගම්වාසීන් දෙදෙනකු සමඟ එකතු වී 2017 වර්ෂයේදී රිට් අයදුමක් ඉදිරිපත් කරන ලදී. කෙසේවෙතත්, අභියාචනාධිකරණය මගින් නඩුවෙහි නොතිසි නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. පසුව සීමාසහිත පාරිසරික පදනම විසින් එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා කිරීමට අවසර ඉල්ලීම සඳහා වන විශේෂ අයදුම්පත ගොනු කරන ලදී.

ඒ සඳහා වන කරුණු විමසීම ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වන විනිසුරු ඊවා වනසුන්දර, විනිසුරු ප්‍රසන්න ජයවර්ධන සහ විනිසුරු නලීන් පෙරේරා හමුවේ සිදු කෙරිණි. එහිදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්

07.11.2017 වන දින අභියාචනාධිකරණය විසින් දෙන ලද තීන්දුව නිෂ්ප්‍රභා කරන ලදී. සියලුම පාර්ශවවල අනුමැතිය සහිතව, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිශ්චය මණ්ඩලය විසින් අභියාචනාධිකරණය වෙත මෙම නඩුව නැවත විභාග කරන මෙන් නියෝග කරන ලදී. පෙත්සම්කරුවන් වෙනුවන් නීතිඥ ආනන්ද ලාල් නානායක්කාර මහතා පෙනී සිටින ලදී.

මෙම නීතිමය ක්‍රියාමාර්ගය මඟින් සීමාසහිත පාරිසරික පදනම විසින් ඇහැටුවැව ප්‍රදේශයේ දැනටමත් සිදුවන අලි-මිනිස් ගැටුම තවත් උග්‍රවීම අවම කිරීමට  අදහස් කරනු ලබයි.